## II වන පරිච්ඡේදය

# පුද්ගලයින් සමහරක් දෙනා ගැන හැඳින්වීම

මෙම වාර්තාවෙහි ප්‍රකට ලෙසින් නම් හෙළිවන සම්හර පුද්ගලයින් ගැන ලුහුඩු හැඳින්වීම් මෙහි පහත පළකරමු. ඔවුන්ගේ නම් මෙහි ලැයිස්තුගත කොට දැක්වෙන්නේ ඔවුන්ගේ පෙළපත් නාම වල මුල් අකුරු අකාරාදි පිළිවෙලට (ඉංග්‍රීසි) එන ලෙසටය. රෝහිත ප්‍රියදර්ශන හා අජිත් ජයසිංහ ගැන හැඳින්වීම් මෙම පරිච්ඡේදයෙහි ඇතුලත් කොට නැත. කුමක් නිසාද යත්, වෙන පරිච්ඡේද දෙකක් ඔවුන් සඳහා පාවිච්චි කොට තිබෙන බැවිනි.

## I. කීර්ති අතපත්තු

වර්ෂ 1972 දී පරිවාසික පොලිස් උප පරීක්ෂකවරයෙකු ලෙස පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුණු මොහු 1990 වේ දී ප්‍රධාන පරීක්ෂක පදවියටත්, 1994 දී සහකාර පොලිස් අධිකාරී පදවියටත් උසස් කරනු ලැබුවේය. පොලිස් පරීක්ෂකවරයකු ලෙස ඔහු 1989 අගෝස්තු මස සිට 1994 දක්වා සපුගස්කන්ද පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධාරී ලෙස ක්‍රියා කළේය. ඔහු සපුගස්කන්ද පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධාරී ලෙස පත්වූයේ එම පොලිස් ස්ථානයට පහරදීම සිදුවීමෙන් නොබෝ කලකට පසුවය. ඔහු උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන 1990 පෙබරවාරි මස 20 වන දින රාත්‍රී අතුරුදහන්වූ අවස්ථාවෙහි සපුගස්කන්ද පොලිස් ස්ථානය භාරව සිටි හෙයින් ඔහුගේ සාක්ෂි බොහෝ වැදගත් විය.

## II. තලීත් දෙල්ගොඩ

පරිවාසික පොලිස් උප පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස 1961 දි පොලිස් සේවයට සම්බන්ධවන ලදුව මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙන අතරතුර පොලිස් සේවයෙන් විශ්‍රාමගත් දෙල්ගොඩ මහතා වසර 36ක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කර තිබිණ. රටේ බොහෝ පළාත්වල සේවය කොට සිටි ඔහු 1978 ජනවාරි මස 01 වන දින සහකාර පොලිස් අධිකාරී පදවියට උසස් කරනු ලැබුවේය. ඔහු 1985 දී පොලිස් අධිකාරීවරයෙක් විය. පොලිස් අධිකාරීවරයකු ලෙසට ඔහුට 1987 සැප්තැම්බර් මස 15 වන දින කැළණිය පොලිස් කොට්ඨාසය පවරන ලදී. ඔහු 1994 පෙබරවාරි මස 24 වන දින නියෝජ්‍ය පොලිස්පතිවරයකු වන තුරුම දිගටම කැළණිය පොලිස් කොට්ඨාසය භාර නිලධාරියා ලෙස ක්‍රියා කළේය. දෙල්ගොඩ මහතා කැළණිය පොලිස් කොට්ඨාසයේ සේවය–කරන අතර තුර 1989 දී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයකු ලෙස උසස් කරනු ලැබුවේය. 1996 මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂිදීමට පැමිණි අවස්ථාවේ ඔහු දකුණු පොලිස් දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා විය.

නියෝජ්‍ය පොලිස්පති එම්.එම්.ආර්. ගුණරත්න මහතා 1989 දෙසැම්බර් මස 12 වන දින දෙල්ගොඩ මහතාට ප්‍රශංසා කරමින් පොලිස්පතිවරයාට ලිපියක් යැවීය. දෙල්ගොඩ මහතා " සිවිල් ඇඳුමින් සැරසුනු කුඩා කණ්ඩායම් විසින් සිදුකරන මෙහෙයුම්". පිළිබඳ සංකල්පය උද්‍යෝගිමත්ව ක්‍රියාත්මක කිරීමට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී එඩ්මන්ඩ් කරුණානායක මහතා ( ගම්පහ පොලිස් කොට්ඨාසයේ කාර්ය භාර නිලධාරී) සමග සහභාගිවී යයි එම ප්‍රශංසාත්මක ලිපියේ සඳහන් කර ඇත. "එබඳු කණ්ඩායම්වලට කඩාකප්පල්කාරීන් සොයා අත්අඩංගුවට ගැනීමට/ විභාග කිරීමට හැකිවේ යයි" එහි තවදුරටත් සඳහන් වේ. මෙම ප්‍රශංසාත්මක ලිපියේ පිටපතක් X 79 ලෙසින් සලකුණු කොට මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී. මෙම ප්‍රශංසාව පදනම් කොට, දෙල්ගොඩ මහතාට වැටුප් වර්ධක දෙකක් දීම නිර්දේශ කරමින් පොලිස්පතිවරයා රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට නිර්දේශයක් ඉදිරිපත් කළේය. මෙම නිර්දේශයේ පිටපතක් X 86 ලෙසින් සලකුණු කොට මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී.

## III. එම්.එම්.ආර්. (මෙරිල්) ගුණරත්න

ගුණරත්න මහතා කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙන අවස්ථාවේ ඔහුගේ වයස අවුරුදු 54ක් විය. ඔහු ද ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකි. ඔහු 1965 දී පරිවාසික සහකාර පොලිස් අධිකාරීවරයෙකු ලෙස පොලිස් දෙපාර්තමේන්තුවට බැඳී 1973 දී පොලිස් අධිකාරීවරයෙක් විය. පොලිස් අධිකාරීවරයෙකු ලෙස ඔහු පොලිස් බුද්ධි අංශයට අනුයුක්ත කරනු ලැබිණි. ගුණරත්න මහතා 1978 දී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පදවියට උසස් කරනු ලැබිණ. 1985 දී ඔහු නියෝජ්‍ය පොලිස්පති පදවියට උසස් කෙරිණ. 1986 ඔක්තෝබර් මාසයේදී ගුණරත්න මහතා ජාතික බුද්ධි කාර්යාංශයේ අධ්‍යක්ෂ තනතුරට පත්කරනු ලැබිණ. 1989 අප්‍රේල් මස 20 වන දින ඔහු මහ කොළඹ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ලෙස පත්කරන ලදී. 1993 දී ඔහු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් විය. ගුණරත්න මහතා කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් අවස්ථාවෙහි සහායක සේවා භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙසින් පොලිස් මූලස්ථානයට අනුයුක්තව සිටියේය. 1989 අප්‍රේල් සිට 1993 අගෝස්තු දක්වා වූ කාලය තුළ කැළණිය පොලිස් කොට්ඨාසය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා වූයේ ගුණරත්න මහතාය.

## IV. අජිත් ජයසිංහ

කරුණාකර VIII වන පරිච්ඡේදය බලන්න.

## V. අර්නස්ට් පෙරේරා මහතා.

පෙරේරා මහතා මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් අවස්ථාවේ ඔහුගේ වයස අවුරුදු 64 කි. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ උපාධිධාරියෙකු වූ ඔහු පරිවාසික

සහකාර පොලිස් අධිකාරීවරයෙකු ලෙස 1957 දී පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුණේය. 1968 දී පොලිස් අධිකාරී පදවියට උසස් කරනු ලැබූ ඔහු වසර 05ක් එම පදවියේ සේවය කළේය. ඉක්බිතිව ඔහු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුරට උසස් කරනු ලැබුවේය. එයින් පසුව 1977 වර්ෂයේදී ඔහු නියෝජ්‍ය පොලිස්පති තනතුරට උසස් කරනු ලැබුවේය. 1988 අගෝස්තු මස 01 වන දින ඔහු පොලිස්පති තනතුරට පත්කරනු ලැබුවේය. ඔහු 1993 නොවැම්බර් මස 28 වන දින දක්වා පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධානත්වය දැරුවේය. වයස අවුරුදු 61ට එළඹි විට ඔහු පොලිස් සේවයෙන් විශ්‍රාම ගත්තේය. එයින් නොබෝ කලකට පසු ඔහු මලයාසියාවේ ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස පත්කරනු ලැබුවේය. 1994 අගෝස්තු මාසයේදී සිදුවූ ආණ්ඩු වෙනසත් සමග ඔහු ශ්‍රී ලංකාවට ආපසු කැඳවනු ලැබීය. එවක පටන් ඔහු රැකියාවක යෙදී නැත. මෙම කොමිසන් සභාවේ නිර්ණෙය විෂයයන්ට අදාල වැඩි කාලය තුළ ( එනම් 1988 ජනවාරි මස 01 වන දින සිට 1990 දෙසැම්බර් මස 31 වනදා දක්වා) පෙරේරා මහතා ශ්‍රී ලංකාවේ පොලිස් සේවයේ ප්‍රධානියා ලෙස කටයුතු කළේය.

## VI. ඩග්ලස් පීරිස්.

ඩග්ලස් පීරිස් 1967 දී පරිවාසික පොලිස් කොස්තාපල්වරයෙකු ලෙස පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුණේය. ඔහුට උප පොලිස් පරීක්ෂක තනතුරකට තෝරා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් තිබුණු හෙයින් ඔහු 1971 වර්ෂයේදී එම තනතුරට තෝරා ගනු ලැබුවේය. 1979 දී ඔහු පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස පත්කරනු ලැබිණ. ඉක්බිතිව ඔහු 1985 දී ප්‍රධාන පොලිස් පරීක්ෂක ධුරයට උසස් කරනු ලැබිණ. ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස ඔහු පෑලියගොඩ පොලිස් ස්ථානයේ මූලස්ථාන පොලිස් පරීක්ෂක ලෙස ( H.Q.I.) කටයුතු කළේය. 1987 ජූලි මස 20 වන දින පීරිස් මහතා වැඩබලන සහකාර පොලිස් අධිකාරීවරයෙකු ලෙස පත්කරනු ලැබිණ. සහකාර පොලිස් අධිකාරීවරයෙකු ලෙස ඔහු කැළණිය පොලිස් කොට්ඨාසයේ " සහකාර පොලිස් අධිකාරී - මෙහෙයුම් " ලෙස ක්‍රියා කළේය. මෙම තනතුර දරමින් ඔහු කැළණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ වැඩ කටයුතු අධීක්ෂණය කළ අතර, ඊට නායකත්වය දුන්නේය.

යමෙකු සහකාර පොලිස් අධිකාරී පදවියෙහි ස්ථිර කරනු ලැබීමට ඊට නියමිත විභාගයකට පෙනී සිට එම විභාගය වසර අවුරුදු 03 ක් වශයෙන් නියමිත කාලය තුළ සමත් වියයුතුය. පීරිස් මහතා අදාල විභාගයට පෙනී සිටියේය. එසේ වුවද විභාගයෙන් සමත්වීමට ඔහුට නොහැකි විය. මේ අනුව 1990 වන විට පීරිස් මහතා සිටියේ ස්ථිර කරනු නොලැබූ සහකාර පොලිස් අධිකාරීවරයෙකු ලෙසය. ඔහු විභාගයෙන් අසමත්වීම හේතු කොට ගෙන ස්ථිර කරනු නොලැබූ තත්ත්වයෙන් සිටි හෙයින් ඔහුට විභාගය සමත්වීමට නියම කෙරෙන කාලසීමාවෙහි දීර්ඝ කිරීමක් ඉල්ලීමට සිදුවිය. එසේ කරනු ලබන ඉල්ලීම් සාමාන්‍යයෙන් ඉටු කරනු ලැබේ. එසේ වුවද එසේ කරනු ලැබූ විට ඔහුට සේවා ජ්‍යෙෂ්ඨත්වය අහිමි වේ. කුමක් නිසාද යත් එම කාලය දීර්ඝ කිරීම දෙනු ලැබීමත් සමග ඔහු ජ්‍යෙෂ්ඨතා ලැයිස්තුවෙහි පහළට වැටෙන බැවිනි.

1990 මෙරට කඩාකප්පල්කාරී කැරැල්ල අවසන්වූ හයි හඟවන වර්ෂය ලෙස කෙනෙකුට පෙනී යයි. 1989 නොවැම්බර් මස 25 වන දින ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තලින් දෙල්ගොඩ නියෝජ්‍ය පොලිස්පති ( මහ කොළඹ දිසාව) එම්.එම්.ආර්. ගුණරත්න මහතාට ලිපියක් යවමින් සහකාර පොලිස් අධිකාරී පීරිස් පොලිස් අධිකාරී තනතුරකට උසස් කිරිම නිර්දේශ කලේය. අදාළ නිර්දේශය තමන් විසින් කරන ලද්දේ තමන්හට සහකාර පොලිස් අධිකාරී පීරිස් මහතා විසින්ම කරන ලද ඉල්ලීමක් අනුව යයි දෙල්ගොඩ ප්‍රකාශ කලේය. ( පීරිස් මහතා පළමුව සහකාර පොලිස් අධිකාරී තනතුරෙහි ස්ථිර කරනු නොලැබ සිටියදීත් මෙසේ උසස් කළහැක්කේ කෙසේදැයි දෙල්ගොඩ මහතා එම ලිපියෙහි විස්තර කර නොතිබුණේය) දෙල්ගොඩ මහතා ඔහුගේ නිර්දේශය තහවුරු කොට තිබුණේ කඩාකප්පල්කාරී කැරැල්ල පැවති කාලයේ සහකාර පොලිස් අධිකාරී පීරිස් විසින් ඉටු කරන ලද වැඩ කටයුතු පිළිබඳ විස්තර ලැයිස්තු කොට දක්වමිනි. අදාළ නිර්දේශයේ පිටපතක් ( ඊට සම්බන්ධ ලියවිලි ද සමග) මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කොට තිබුණේය. එය සළකුණු කොට තිබුනේ "X 71" ලෙසිනි. දෙල්ගොඩ මහතා එම ලිපියෙහි සහකාර පොලිස් අධිකාරී පීරිස් " ඔහු (එනම් සහකාර පොලිස් අධිකාරී පීරිස්) කඩාකප්පල්කාරී ව්‍යාපාරය ඉදිරියට යෑම වැළැක්වීමටත්, කඩාකප්පල්කාරී පුද්ගලයින් ඉවත් කොට දැමීමටත් වගකිවයුතු වන බව" වෙනත් දේ අතර සඳහන් කරයි. " ඉවත් කොට දැමීමට" යන වචනයෙහි තේරුම විමසා දැනගැනීම කෙරෙහි කොමිෂන් සභාව උනන්දුව දැක්විය. එම වචනය භාවිතා කළ අවස්ථාවෙහි දෙල්ගොඩ මහතා එයින් අදහස් කලේ කුමක්ද? මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කරනු ලැබූ අවස්ථාවෙහි දෙල්ගොඩ සකස් කරන ලද පාඨයක් කියවීමෙන් කරුණු දැක්විය. මෙම කරුණු ඇතුලත්වූ පාඨය "X 72" වශයෙන් සළකුණු කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී. ඉවත් කොට දැමීම යන වචනයෙන් අදහස් කරන ලද්දේ සහකාර පොලිස් අධිකාරී පීරිස් විසින් සිදුකරන ලද " යුක්ති සහගත මනුෂ්‍ය ඝාතන " යයි විස්තර කොට දැක්වීමට දෙල්ගොඩ පෙරකී පාඨයෙන් තැත් කලේය. සේවයෙන් උසස් කරනු ලැබීමේ සුදුසුකමකට යුක්ති සහගත මනුෂ්‍ය ඝාතන සිදුකිරීම සමාන වන්නේ කෙසේදැයි විස්තර කිරිමට දෙල්ගොඩ අසමත් විය.

(හදිසි අවස්ථා රෙගුලාසිවල විෂය පථයට අයත්වන) යුක්තිසහගත මනුෂ්‍ය ඝාතන හඳුන්වනු ලැබුනේ " 55FF ව්‍යවස්ථා මරණ" යනුවෙනි. අදාල කාලසීමාව තුළදී සම්පූර්ණ කැළණිය පොලිස් කොට්ඨාසයෙන්ම වාර්තාවී තිබුනේ එබඳු මරණ පහක් පමණකි. අදාල වචනයේ සාමාන්‍ය තේරුම " නැතිකර දමනවා" හෝ " මරණවා " යන්න බවට ඔහු තමාගෙන් ප්‍රශ්ණ කල නීතිඥයා සමග එකඟ විය. මෙම තත්ත්වය යටතේ අදාල කාලසීමාවේදී පාවිච්චි කරන ලද පොලිස් කථා ව්‍යවහාරය අනුව මෙම වචනයේ නියම ප්‍රායෝගික අර්ථය අනිකුත් සාක්ෂිකරුවන්ගෙන් අනාවරණය කර ගැනීමට නීතිඥවරයා ඉදිරිපත්ව ක්‍රියා කලේය. " ඉවත් කොට දැමීම" යන්නෙන් ඇත්ත වශයෙන්ම අදහස් කරන්නේ " අධිකරණ ක්‍රමයෙන් බාහිරව" (කඩාකප්පල්කාරීන්) ඝාතන කිරිම බවු-එවකට සිටි පොලිස්පති (I.G.P.) ආර්නස්ට් එඩ්වර්ඩ් පෙරේරා මහතා අන්තිමේදී සාක්ෂි දෙමින් ඉතා අවංකව පිළිගත්තේය. එම නිසා සහකාර පොලිස් අධිකාරී පීරිස්ගේ සේවා උසස් කිරිමට ප්‍රධාන හේතුව වූයේ ඔහු " කඩාකප්පල්කාරීන් අධිකරණ ක්‍රමයට බාහිරව ඝාතනය කිරීමෙන්

කඩාකප්පල්කාරී ව්‍යාපාරය ඉදිරියට යාමෙන් වැලැක්වීම" බව දැන් ඉතා පැහැදිලිව පෙනී යයි.

යට සඳහන් නිර්දේශය ලද නියෝජ්‍ය පොලිස්පති ගුණරත්න 1989 දෙසැම්බර් මස 12 වන දින සහකාර පොලිස් අධිකාරී පීරිස් ගැන නිර්දේශයක් සකසා පොලිස්පතිවරයාට ඉදිරිපත් කළේය. එම නිර්දේශයේ පිටපතක් X 88 වශයෙන් ලකුණු කොට කොමිෂන් සභාව හමුවේ තබන ලදී. මෙම නිර්දේශයෙන් තහවුරු නොවෙතත්, එම නිර්දේශය තමා සකසා පොලිස්පතිවරයාට ඉදිරිපත් කළේ එසේ කරන ලෙස පොලිස්පතිවරයා තමාගෙන් ඉල්ලා සිටි නිසා යයි නියෝජ්‍ය පොලිස්පති ගුණරත්න ප්‍රකාශ කළේය. එකී නිර්දේශයට ඔහු වෙත ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී දෙල්ගොඩ විසින් සහකාර පොලිස් අධිකාරී පීරිස් ගැන එවා තිබුණු නිර්දේශය අමුණා තිබුණේය. සහකාර පොලිස් අධිකාරී පීරිස් , සහකාර පොලිස් අධිකාරී ගාමිණී සිල්වා ( ගම්පහ කොට්ඨාසයේ) හා සමග ජනතා විමුක්ති පෙරමුණට විරුද්ධ ව්‍යාපාරය ගෙනයාමට "පුරෝගාමීව" ක්‍රියා කළ බව සඳහන් කර තිබේ. "ඔවුන් ජනතා විමුක්ති පෙරමුණ පළමුව අස්ථාවර කිරීමටත්, ඊට පසුව එහි පිරිහීම ඇති කිරීමටත් ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කළහ"යි එයින් තවදුරටත් සඳහන් කෙරේ. " ගරු රනිල් වික්‍රමසිංහ, ගරු ජෝෂප් මයිකල් පෙරේරා සහ ගරු ජෝන් අමරතුංග යන අය මෙම නිලධාරීන් දෙදෙනාගේ පැහැදිලි දායකත්වය ගැන හොඳින්ම දැන සිටියහ" කියාත් ඔහු ප්‍රකාශ කරයි. තමා අදාළ නිර්දේශය කිරීමෙන් තුදෙක් අපේක්ෂා කළේ සහකාර පොලිස් අධිකාරී පීරිස්ට වැටුප් වර්ධක දෙකක් ලබාදීම යයි නියෝජ්‍ය පොලිස්පති ගුණරත්න ප්‍රකාශ කළේය.

පෙරකී නිර්දේශ දෙක ලැබුණු පොලිස්පතිවරයා මෙම කාරණය ගැන රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට ලිපියක් යැවීය. 1989 දෙසැම්බර් මස 21 වන දිනෙන් යුත් මෙම ලිපිය X 42 යනුවෙන් සලකුණු කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී. මෙසේ ඉදිරිපත් කරන ලද නිර්දේශය පදනම් කොට මෙම කාරණය ගැන රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කරන ලද බව පෙනී යයි. මෙම අමාත්‍ය මණ්ඩල සංදේශය කලින් සිටි ජනාධිපති රණසිංහ ප්‍රේමදාස විසින් 1990 පෙබරවාරි මස 06 වන දින අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. මෙම අමාත්‍ය මණ්ඩල සංදේශයේ අඩංගු නිර්දේශ පදනම් කොට අමාත්‍ය මණ්ඩලය පහත සඳහන් පියවර ගැනීමට තීරණය කළේය.

(අ) සහකාර පොලිස් අධිකාරී පීරිස් අදාළ සේවයේ ස්ථිර කිරීමේ විභාගය සමත්වීමෙන් නිදහස් කිරීමට.

(ආ) ඔහු එම පදවියෙහි අතීතයටද බලපවත්වන සේ එනම්, 1988 ජුලි මස 20 වන දින සිට ක්‍රියාත්මක වනසේ ස්ථිර කිරීමට සහ

(ඇ) ඔහු පොලිස් අධිකාරී (II වන ශ්‍රේණිය) තනතුරකට 1990 පෙබරවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස් කිරීමට.

අදාල අමාත්‍ය මණ්ඩල තීරණයේ පිටපතක් X 43 ලෙසින් සළකුණු කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදි. සාක්ෂිකරුවන් කීපදෙනෙක් කී පරිදි මෙය පෙර නුවූ විරූ ක්‍රියාමාර්ගයකි. ඩග්ලස් පීරිස්ට ලැබූ උසස්වීම් මාලාව නිසා ඔහු හිටි අඩියේම ගැසට් කළ පොලිස් නිලධාරීන් 130 දෙනෙකු ඉක්මවා ජ්‍යෙෂ්ඨත්වයෙන් ඉහළ නැංගේය. පොලිස් දෙපාර්තමේන්තුවේ ඉතිහාසයේ වෙනත් කිසිත් පොලිස් නිලධාරියෙකු එබඳු සේවා උසස්වීමක් ලබා නැත. එය කවරදාකවත් පොලිස් සේවයේ සිදුකරන ලද " දිගම දුර පැනීම" යයි නීතිඥතැන සමග එකඟවීමට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පාලන) ආචාර්ය ධර්මදාස සිල්වා මහතා විසින් පෙලඹිණ. අන්තිමට පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් පොලිස් අධිකාරී ( 1 වන ශ්‍රේණිය) පදවියට උසස් කරනු ලැබිණ. ඉක්බිතිව ඔහු විසින් සිදුකරන ලදැයි කියන බරපතල වැරදි සම්බන්ධ විමර්ශණයක් සිදුවන්නේය යන්න පාදක කොට 1995 වර්ෂයේදි ඔහුගේ රාජකාරී තහනම් කරනු ලැබිණ.

මෙහි ආරම්භක පරිච්ඡේදයෙහි සඳහන් කරන ලද පරිදි, සහකාර පොලිස් අධිකාරී පීරිස් හදිසියේම අතුරුදහන්ව කොමිෂන් සභාව ඉදිරියට පැමිණීම නැවතින. ඔහුට කොමිෂන් සභාව ඉදිරියේ අඛණ්ඩව පිළිවෙලට පෙනී සිටීමට බැඳීමක් නොවූයෙන්, කොමිෂන් සභාව එම කාරණය ගැන කිසිත් විමර්ශණයක් කිරීමට සැළසුවේ නැත. කෙසේ වුවද පීරිස් මහතා රහසිගතව රටින් බැහැරව ගොස් තිබෙන බව පසුව වාර්තා කරනු ලැබින. ඩග්ලස් පීරිස් 1996 ජුලි මස 20 වන දින රටින් බැහැරව ගොස් තිබෙන බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් කරන ලද විමර්ශණයන්ගෙන් හෙළිවිය. පීරිස් මහතා රටින් පිටව යාමට පෙර " තල්පාවිල විදාන කංකානම්ගේ විමලසේන " යන නම පාවිච්චි කරන්නේය යන ව්‍යාජ හේතුව දක්වමින් ව්‍යාජ ගමන් බලපත්‍රයක් ලබාගෙන ඇත. මෙම ගමන් බලපත්‍රය ලබාගැනීම සඳහා ඔහු දී ඇති ලිපිනය " නො. 37, නුවර පාර, පීරිස් මාවත, කැළණිය" යන්නය. ගමන් බලපත්‍ර අයදුම්පතේ පිටපතක් ( මෙහි අඩංගු වන්නේ බොරු තොරතුරුය.) X 53 ලෙසින් සඳහන් කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදි. එම අයදුම්පතෙහි ඩග්ලස් පීරිස්ගේ නිවැරදි ජායාරූපයක් අන්තර්ගත විය.

පීරිස් ශ්‍රී ලංකාවෙන් පිටව ගියේ කෙසේදැයි ඔප්පු කොට දැක්වීමට නොහැකි විය. කෙසේ වුවද, ඔහු 1996 ජුලි මස 22 වන දින බොම්බායෙන් ටී.ජී. 970 යන අංකය දරන ගුවන් යානයකින් ගුවන් ගමනක යෙදී තිබෙන බව ජාත්‍යන්තර පොලීසියෙන් ලබා ගෙන තිබෙන කරුණුවලින් පෙනී යයි. අංක ටී.ජී. 970 දරන ගුවන් යානයෙන් එදිනම ඔහු බැංකොක් නුවරට සේන්දුවී ඇත. ඉක්බිතිව අගෝස්තු මස 09 වන දින පීරිස් ස්විට්ස්ර්ලන්තය බලා ගොස් තිබේ. ස්විට්සර්ලන්තයේ සූරිච් නුවරට සම්ප්‍රාප්තවී ඔහු දේශපාලන ආරක්ෂාව පතන්නකුගේ තත්ත්වය තමන්ට ලබාදෙන ලෙස ආයාචනා කර ඇත. දේශපාලන රැකවරණය සඳහා ඔහු විසින් ඉදිරිපත් කර තිබෙන අයදුම්පත සළකා බලන තුරු ස්විට්සර්ලන්තයේ රැඳී සිටීමට ස්විට්සර්ලන්ත බලධාරීහු ඔහුට තාවකාලික අවසරයක් දුන්හ. පීරිස් විසින් දේශපාලන රැකවරණය සඳහා හේතු වශයෙන් ඉදිරිපත් කරන ලද ප්‍රධාන කාරණය නම්, ශ්‍රී ලංකාවට පෙරලා පැමිණි විට හිංසා පීඩා කිරීමට භාජනය වන බවය. ස්විට්සර්ලන්ත බලධාරීහු ඩග්ලස් පීරිස් ඉදිරිපත් කරන කරුණු පිළිනොගැනීමට තීරණය කළ අතර, ඔහුට දේශපාලන රැකවරණය සැළසීම ප්‍රතික්ෂේප

කළේය. පිරිස් විසින් දක්වන ලද හේතු ගැන ඔවුන් සැහීමට පත්වූයේ නැත. කෙසේ වුවද ස්විට්සර්ලන්ත නීතිය අනුව, ප්‍රතික්ෂේප කිරීමේ නියෝගයට විරුද්ධව ඇපෑලක් ඉදිරිපත් කිරීමට ඔහුට 1997 ජනවාරි මස 31 වන දින දක්වා කල් ලැබිණ. එම කාලසීමාව තුළදී ඔහු නැවතත් අතුරුදහන් විය. එම මොහොතේ සිට ඩග්ලස් පීරිස් ආගිය අතක් හෝ සිටින තැනක් හඟවන කිසිත් තොරතුරක් කොමිෂන් සභාවට ලැබුනේ නැත. එසේ වුවද, ඔහුගේ නීතිඥයා වන තලිත් ලද්දුවහෙට්ටි වරින් වර කොමිෂන් සභාවේ කටයුතු වාර්තාවල පිටපතුත්, කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලියවිලිවල පිටපතුත් සපයන ලෙස ඉල්ලීම් කළේය. මෙම අයදුම්පත් වලින් ඉල්ලා සිටින දේ සැපයීමට ඉඩ දෙන ලද අතර, අවශ්‍ය කටයුතු වාර්තා නීතිඥවරයා වෙත මුදාලන ලදී.

කෙසේ වුවද, 1996 අගෝස්තු මස 14 වන දින ඩග්ලස් පීරිස් විසින් එවන ලදැයි දැක්වුනු ලියවිල්ලක් කොමිෂන් සභාවට ලැබිණ. එය දිවුරුම් පත්‍රයක් බඳු විය. මෙම ලියවිල්ලේ නිර්ව්‍යාජත්වය නිශ්චය කරගනු පිණිස මෙම ලියවිල්ල සහතික කරන ලදැයි කියැවෙන සමාදාන විනිශ්චයකාරවරයා ඇත්ත වශයෙන්ම එසේ කරන ලද්දේදැයි දැනගැනීමට විමර්ෂණයක් කරන ලදී. ලියවිල්ලේ සඳහන් සමාදාන විනිශ්චයකාරවරයා එය සහතික නොකරන ලදැයි විමර්ෂණවලින් අනාවරණය විය. මෙම හේතුව නිසා, අදාල ලියවිල්ලේ අඩංගු කරුණු සළකා බැලූයේ නැත.

## vii. රෝහිත ප්‍රියදර්ශන

කරුණාකර VII වන පරිච්ඡේදය බලන්න.

## viii. රනිල් වික්‍රමසිංහ

පාර්ලිමේන්තුවේ වර්තමාන විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා එක්සත් ජාතික පක්ෂයේ නායකයාය. වරක් ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යවරයා වූ වික්‍රමසිංහ මහතා දේශපාලන කරලියට පැමිණියේ 1977 දී බියගම ආසනය නියෝජනය කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ( එ.ජා.ප.) ලෙසටය. එවක් පටන් ඔහු අඛණ්ඩව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස ක්‍රියා කර ඇත. 1978 දී ඔහු විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිවරයා ලෙස පත්කරනු ලැබුවේය. ඊට පසුව වික්‍රමසිංහ මහතා කැබිනට් අමාත්‍ය මට්ටමට උසස් කරනු ලැබ ඔහුට අධ්‍යාපන හා යෞවන කටයුතු අමාත්‍යාංශය භාර කරනු ලැබුවේය. 1993 දී ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතා ඝාතනය කරනු ලැබීමෙන් නොබෝ දිනකින්ම ජනාධිපති ප්‍රේමදාස මහතාගේ රජයේ අග්‍රාමාත්‍යවරයා වූ ඩී.බී. විජේතුංග මහතා ජනාධිපති ලෙස පත්කරනු ලැබිණ. අග්‍රාමාත්‍ය තනතුරේ ඇතිවූ පුරප්පාඩුවට රනිල් වික්‍රමසිංහ මහතා පත්කැරිණ. 1994 අගෝස්තු මස 16 වන දින එක්සත් ජාතික පක්ෂ රජය පරාජය වන තෙක්ම එම මහතා අග්‍රාමාත්‍ය ලෙස කටයුතු කළේය. එක්සත් ජාතික පක්ෂය පාර්ලිමේන්තුවේ ප්‍රධාන විපක්ෂ දේශපාලන පක්ෂය වූ අවස්ථාවේ වික්‍රමසිංහ මහතා විරුද්ධ පක්ෂයේ නායකයා ලෙස පත් කරනු ලැබුවේ නැත. කුමක් නිසාද යත් 1994 අගෝස්තු මාසයේදී එක්සත් ජාතික පක්ෂ පාර්ලිමේන්තු

මන්ත්‍රීවරුන්ගේ රහස් ඡන්දයකින් ගාමිණී දිසානායක මහතා විපක්ෂනායක ලෙස තෝරා පත්කර ගත් බැවිනි. ඉක්බිතිව, හදිසියේ සිදුවූ ගාමිණී දිසානායක මහතාගේ ඝාතනය නිසා 1994 දෙසැම්බර් මාසයේදී රනිල් වික්‍රමසිංහ මහතා විපක්ෂ නායක ලෙස පත්කොට ගන්නා ලදී. පරීක්ෂණයට අදාල කාලය තුළ ( එනම්, 1988 ජනවාරි මස 01 වන දින සිට 1990 දෙසැම්බර් මස 31 වන දින දක්වා) වික්‍රමසිංහ මහතා යොවුන කටයුතු හා රැකීරක්ෂා අමාත්‍යවරයා ( 1989 ජනවාරි අග දක්වා) ලෙසද, ඉන්පසුව කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයා ලෙසද කටයුතු කළේය. මෙම කාලසීමාව තුළදී ඔහු පාර්ලිමේන්තුවේ ගම්පහ මැතිවරණ දිස්ත්‍රික්කය නියෝජනය කළේය. එසේ වුවද නියම වශයෙන්ම ( තත්වාකාරයෙන්ම) නියෝජනය කළේ ගම්පහ දිස්ත්‍රික්කයට අයත් වූ බියගම මැතිවරණ කොට්ඨාසයයි. සපුගස්කන්ද හා බටලන්ද ගම වැටෙන්නේ බියගම මැතිවරණ කොට්ඨාසය තුළටය.

## IX. රංජිත් වික්‍රමසිංහ

1958 දී පොලිස් කොස්තාපල්වරයකු ලෙස පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුනු ඔහු 1972 දී පොලිස් සැරයන් පදවියටත්, 1982 දී පොලිස් උප පරීක්ෂක පදවියටත් පත්කරන ලදී. 1988 දී පොලිස් පරීක්ෂකවරයෙකු වූ ඔහු 1994 දී ප්‍රධාන පොලිස් පරීක්ෂක පදවියට උසස් කරනු ලැබුවේය. කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂිදීමට සති කිහිපයකට කලින් ඔහු පොලිස් සේවයෙන් විශ්‍රාම ගත්තේය.

1978 මාර්තු මාසයේදී ඔහු කැලණිය පොලිස් කොට්ඨාසයට මාරු කරනු ලැබුවේය. 1987 දී වික්‍රමසිංහ මහතා කැලණිය පොලිස් කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ කාර්ය භාර නිලධාරියා ලෙස පත්කරනු ලැබුවේය. ඔහු 1990 නොවැම්බර් මාසය වනතුරු මෙම තනතුර දරා තිබේ. කැලණිය පොලිස් කොට්ඨාසයෙන් පිට වික කලක් සේවය කිරීමෙන් පසු ඔහු කැලණිය පොලිස් කොට්ඨාසයට යළි පැමිණ ඉන්පසු 1994 අවසන් වනතුරු එහි සේවය කර තිබේ. ආරම්භයේ දී කැලණිය පොලිස් කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය ක්‍රියාත්මක වී තිබෙන්නේ පැලියගොඩ පොලිස් ස්ථානයේය.